**ශීර්ෂය 228 - අධිකරණ පරිපාලනය දෙපාර්තමේන්තුව**
**-------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

අධිකරණ පරිපාලනය දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ පරිපාලනය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019ජූලි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරීවෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අධිකරණ පරිපාලනය දෙපාර්තමේන්තුවටඅදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූලි 10 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරීවෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018දෙසැම්බර් 31 දිනට අධිකරණ පරිපාලනය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේනිලධාරීගේ වගකීම
**-------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේවගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අධිකරණ පරිපාලනයදෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීසහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින්

කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුවේඅභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳවප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) අධිකරණ පරිපාලනය දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දෙපාර්තමේන්තුවවිසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට කෙරීගෙන යන වැඩ වටිනාකම රු.3,375,669,923 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් නොකිරීම නිසා මුළු වත්කම් හා මුළු වගකීම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | කෙරීගෙන යන වැඩ වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කළයුතු වීම. | සමාලෝචිත වර්ෂයට අදාල දේපල පිරියත හා උපකරණවල නිමි වටිනාකම පමණක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ඇතුළත් කර ඇති අතර විගණනයේ දී පෙන්වා දී ඇති පරිදි කෙරීගෙන යන වැඩ වටිනාකම ඉදිරි වර්ෂයේ සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) ඉදිකිරීම් ව්‍යාපෘති 12 ක් වෙනුවෙන් 2017 හා 2018 වර්ෂවලදී ලබාදුන් රු.122,699,334 ක (**Vat** රහිත) අත්තිකාරම් මුදල හා එම අත්තිකාරම් මුදලින් 2018 වර්ෂයේ දී අය කරගත් අත්තිකාරම් රු.47,261,952 ක් කුලී සහ වැඩ අත්තිකාරම් ගිණුමට සහ සංචිත ගිණුමට ඇතුළත් නොවීම නිසා එම ගිණුම් දෙකෙහි ශේෂයන් රු.75,437,382 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි. | 2016 අගෝස්තු 03 දිනැති අංක 250/2016(I) දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයෙහි (3) හා (4) ඡේද අනුව අත්තිකාරම් මුදල් ගෙවීම හා අත්තිකාරම් අයකර ගැනීම ගිණුම්ගත කළයුතු වීම. | ඉදිරියේ දී ආරම්භ කිරීමට නියමිත සියළුම ව්‍යාපෘති සඳහා අත්තිකාරම් ගිණුම් සහ අත්තිකාරම් සංචිත ගිණුම් ආරම්භ කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයඅනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් සඳහා මුදල් වැය කිරීම රු.7,276,557,381 ක් වුවද ඒසීඒ - 2 (II) ආකෘතිය අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් සඳහා මුදල් පොතට අනුව දරන ලද වියදම රු.6,289,247,205 ක් වීම | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයෙහි 3.6 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළයුතු වීම. | ශීර්ෂ අංක 228අධිකරණ පරිපාලන වැය විෂයයට අදාලව මුදල් පොත් පවත්වාගන යනු ලබන්නේ දිවයින පුරා පිහිටි මහාධිකරණ හා අනෙකුත් අධිකරණ විසිනි. එම සටහන් අමාත්‍යාංශය වෙත වාර්තා කරනු ලබන්නේ මාසික ගිණුම් සාරාංශ මගිනි. එම ගිණුම් සාරාංශ සියල්ල ඒකාබද්ධ කර අමාත්‍යාංශය විසින් සකස් කරනු |

| | | |
|---|---|---|
| හේතුවෙන්රු.987,310,176ක වෙනසක් පැවතුණි. | | ලබන ගිණුම් සාරාංශ පදනම් කර ගෙන මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන මුද්‍රිත භාණ්ඩාගාර පිටපත් වල ඇති තොරතුරු වලින් වෙනත් දෙපාර්තමේන්තු විසින් දරන ලද වියදම අඩු කර ඉතිරි ශේෂය මුදල් පොත අනුව වියදම ලෙස සලකා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත .ඉහත දක්වා ඇති ප්‍රායෝගික ගැටළුව නිසා මුදලින් දරන ලද සත්‍ය වියදම මුදල් පොත් අනුව සසඳා ලබා ගැනීම අපහසු වී ඇත.ඉදිරියේ දී මේ සඳහා අවශ්‍ය තොරතුරු අධිකරණ වෙතින් ගෙන්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. |

**1.6.3රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ වාර්ෂික සැසඳුම් ප්‍රකාශය අනුව හිඟ ණය ශේෂවල එකතුව රු.22,442,012 ක් වූ අතර, ඒ තුළ ඇතුළත් වසර 05 කට වැඩි කාලයක් ගතවූ ණය ශේෂ එකතුව රු.8,675,188 ක් විය. | 2004 ඔක්තෝම්බර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1 ඡේදය, 3 ඡේදය, ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ04 වගන්තියප්‍රකාරව කටයුතු කළයුතු වීම. | එම මුදලින් රු.641.959.95 ක් 2019 ජුනි 30 දින වන විට අයකර ගැනීමට කටයුතු කර ඇත. ණය අය කර ගැනීම පිළිබඳව විශේෂ අවධානය යොමු කර කටයුතු කරන මෙන් අදාල අධිකරණයන් හි නිලධාරීන් දැනුවත් කර ඇත. එම නිලධාරීන් විසින් එම හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) 2018 දෙසැම්බර් 31 දිනට කේවලශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය අතරරු.13,038,442 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද එම වෙනසට හේතු වූ කරුණු පැහැදිළිව සඳහන් කර නොතිබුණි. | 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය අනුව කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය අතර වෙනසක් ඇති විට එම වෙනසට හේතු වූ කරුණු පැහැදිලිව සටහන් කළයුතු වීම. | මහාධිකරණ කලාප ගිණුම් අනුව කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා මහාධිකරණ පාලන ගිණුමේ ශේෂය අතර නොසැසඳීම් වලට බලපාන හේතු අදාල මහාධිකරණය විසින් ඉදිරිපත් කර ඇති කලාප ගිණුමේ දක්වා ඇත. නමුත් දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව |

| | | |
|---|---|---|
| | | අතර නොසැසඳීම් වසර 20 කට අධික කාලයක සිට පැවත එන අතර පෙර වර්ෂයන්ට අදාලව නොසැසඳීම්වලට හේතු නිශ්චිතව සොයා ගැනීමට නොහැකි වී ඇත. |
| (ඇ) 2018 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් “බී” ගිණුම අනුව කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තු පාලන ගිණුමේ මුළු වෙනස රු.13,038,442 ක්වූ අතර අධිකරණ කළාප 25 හි කේවල ශේෂ වර්ගීකරණ සාරාංශ හා දෙපාර්තමේන්තු පාලන ගිණුම් ශේෂවල වෙනස ඊට සමාන වියයුතු වුවද එකී වටිනාකම රු.714,948 ක් විය. | 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය අනුව කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය අතර වෙනසක් ඇති විට එම වෙනසට හේතු වූ කරුණු පැහැදිලිව සටහන් කළයුතු වීම. | මහාධිකරණ කළාප විසින් ඉදිරිපත් කර ඇති ගිණුම් කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුම අතර ඇති නොසැසඳුනු ශේෂ හඳුනාගෙන ඊට හේතු වූ කරුණු සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ විශේෂ අවධානය යොමු කර කටයුතු කරන මෙන් ද එහි ප්‍රගතිය අමාත්‍යාංශය වෙත වාර්තා කරන මෙන්ද අදාල අධිකරණයන් වෙත දැනුම් දී ඇති අතරම එහි ප්‍රගතිය අමාත්‍යාංශය විසින් වරින් වර පරීක්ෂා කෙරේ. |

**1.6.4** තැන්පතු

----------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මුළු තැන්පත් ශේෂයන් සම්බන්ධයෙන් ඒ ඒ අධිකරණ කළාපවලින් කාලවිශ්ලේෂණයන් ඉදිරිපත් කර නොමැති අතර, තැන්පත් ශේෂයන්හි අධිකරණ පරිපාලනයට අදාලව අමාත්‍යාංශයේ පවතින තැන්පත් ගිණුම් සඳහා පමණක් කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව වසර දෙකකට වැඩි කාලයක් ගත වූ තැන්පත් ශේෂය රු.35,510,959 ක්වූ අතර, එය මුළු තැන්පත් මුදලින් සියයට 15 ක් විය. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | අධිකරණ කලාපවලට අදාලව විශාල තැන්පතු ප්‍රමාණයක් පවතින බැවින් කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීම ප්‍රායෝගිකව අපහසුය. ප්‍රධාන කාර්යාලය සඳහා පමණක් කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර ඇත. |

**1.6.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතික වීම කළ යුතුවතිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික වියයුතු වුවත්, වාර්තාවේ 3.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | විගණන විමසුම් වලට අදාල පැරණි ලිපිගොණු පරික්ෂා කර කරුණු අධ්‍යනය කිරීමෙන් අනතුරුව පිළිතුරු සකස් කලයුතු වන බැවින් විගණන විමසුම් වලට පිළිතුරු ලිවීමේ දී කාල පමාවක් සිදු වී ඇත. නමුත් ඉදිරියේ දී නියමිත දිනට විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට පියවර ගන්නා ලෙසට අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී. |

**1.6.6නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධානගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| **ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| **(i)**මුදල් රෙගුලාසි 104 (1) (අ) | පාඩුවක් හෝ හානියක් සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමටත් එයට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ ආරම්භ කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ සිදු වූ වාහන අනතුරු 10 කට අදාලව අලාභයන් තක්සේරු කර එම අලාභයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 (1) (අ) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබා ගෙන ගිණුම් වලට ඇතුළත් කිරීමට කටයුතු කරන ලෙසට අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |

| | | | |
|---|---|---|---|
| **(ii)**මුදල් රෙගුලාසි 109 (1) හා (2) | වාහන අනතුරු 55 කට අදාලව වූ රු.2,880,138 ක අලාභ සම්බන්ධයෙන් වර්ෂ 01 ක සිට වර්ෂ 10 ක් දක්වා කාලයක් ගත වී තිබුණත් එම අලාභ සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 109 (1) හා (2) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වර්තමානයේ සිදු වන වාහන අනතුරුවලට අදාල අලාභ හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව නිසි පරිදි කටයුතු කර ගෙන යන අතර විගණනය විසින් විමසීම් කර ඇති පැරණි වාහන අනතුරුවලට අදාල පරික්ෂණ පැවැත්වීම සම්බන්ධව පවතින ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමට කටයුතු කර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| **(iii)**මුදල් රෙගුලාසි 396(ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට මහාධිකරණ කලාප 20 කට අයත් බැංකු ගිණුම් 61 ක බැංකුවට ඉදිරිපත් නොකරන ලද මාස 06 ඉක්ම වූ රු.2,568,001 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | විගණන විමසුමේ දක්වා ඇති කරුණු නිවැරදි වේ. එමගින් පෙන්වා දී ඇති මාස 06 ඉකුත් වූ තවදුරටත් නිශ්කාශනය නොවූචෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 අනුව කටයුතු කරන ලෙසට උපදෙස් ලබා දී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

-------------------------

### 2.1 වියදම් කළමනාකරණය

----------------------------

#### (අ) ප්‍රතිපාදන උපයෝජනය කර නොගැනීම

--------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) ගාල්ල අධිකරණ සංකීර්ණය ඉදිකිරීම වෙනුවෙන් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.මිලියන 250 ක්වූ අතර, ඉන් රු.මිලියන 87.26 ක් මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයයකට මාරු කිරීමෙන් පසු ඉතිරිය රු.මිලියන 162.74 ක් විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | ප්‍රතිපත්තිමය හේතූන් මත ගාල්ල අධිකරණ සංකීර්ණය වෙනත් ස්ථානයක ඉදිකිරීමට තීරණය වූ බැවින් මෙම මුළු ප්‍රතිපාදනය වන රු.මිලියන 250 ඉතිරි විය.කෙසේ වූවත් මුදල් රෙගුලාසි 66 මඟින් ඉන් කොටසක් වෙනත් ව්‍යාපෘති වෙත මාරු කර ගැනීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ii) | ස්වයංක්‍රීය නඩු ගොනු කළමනාකරණ -එම- පද්ධතියක් වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් රු.මිලියන 50 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට එම ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | | මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන වෙන් කල ද ව්‍යාපෘතිය ආරම්භ කිරීමට යාමේ දී අධිකරණ පද්ධතිය තුල ඊට සුදුසු වාතාවරණයක් සකස් කිරීම සඳහා මූලික පහසුකම් නොපැවතීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. |

**(ආ) ප්‍රතිපාදන ඌන උපයෝජනය**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූලධන වැය විෂයයන් 11 ක් සඳහා සලසා තිබුණුරු.මිලියන 1,321.60 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනවලින් රු.මිලියන 618.76 ක් හා පුනරාවර්තන වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 2.58 ක්වූ ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.මිලියන 1.00 ක් ඉතිරි වී තිබුණි. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක සිට සියයට 97 ක් දක්වා අතර පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | මූලධන වැය විෂයයන්ට අදාල ව්‍යාපෘති කර ගෙන යාමේ දී මතු වී ඇති ප්‍රායෝගික ගැටළු හා ප්‍රතිපත්තිමය තීරණ මත සමහරක් ව්‍යාපෘතිවල කාර්ය සාධනය දූර්වල වී ඇති අතර නිසිපරිදි භාණ්ඩාගාරයෙන් අක්මුදල් නොලැබීම නිසා ගෙවීම් කිරීමට නොහැකි විය. මෙම හේතූන් නිසා වර්ෂය සඳහා වූ ප්‍රතිපාදන ඉතිරි විය. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂිකව පුනරාවර්තනය වන සේවාවන් හෝ සැපයුම් යටතට අයත් නොවන පුනරාවර්තන වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයේ ඉතිරිය ඉක්මවා රු.මිලියන 10.18 ක බැරකම්වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි 94(1) හා මුදල් රෙගුලාසි 94(2) අනුව කටයුතු කළයුතු වීම | මුදල් රෙගුලාසි 94(2) අනුව වාර්ෂික පුනරාවර්තන සේවාවන් හෝ සැපයුම් යටතට අයත් නොවන පුනරාවර්තන වැය විෂයයන් සඳහා ශුද්ධ ප්‍රතිපාදනය උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා බැරකම් වලට බැඳීමට විවිධ කරුණු හේතු වූ අතර අධිකරණ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය බැවින් මෙසේ කටයුතු කිරීමට සිදු වී ඇති බව වැඩි දුරටත් දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ වර්ෂය සඳහා යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඇතුළත් කර නොතිබුණි. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වීම. | 2014/1රාජ්‍ය මුදල් චක්‍රලේඛය නිකුත් කිරිමෙන් පසු 2015 සැප්තැම්බර් 22දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද **“MNPEA/PLN/APG/15”** අංක දරන 2015 ඔක්තෝබර්14 දිනැති මාර්ගෝපදේශය හා 2015නොවැම්බර් 13 දිනැති **“PC/MD/P/AP”**දරන ජනාධිපති ලේකම්ගේ ලිපියේ උපදෙස් අනුව 2018වර්ෂයේ මූලධන වියදම් සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඉදිරිපත් කරන ලද බව දන්වමි. |

**3.2 ආරම්භ නොකළ ව්‍යාපෘති**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) “අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ පරිපාලනය යටතේ පවත්නා කාර්යාල, නිල නිවාස සහ උසාවිහි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම” ව්‍යාපෘතිය යටතේ නාවික හමුදාව මඟින් ඉදිකිරීම් කරවා ගැනීමට යෝජිත පහත ඉදිකිරීම් ව්‍යාපෘති තුනෙහිම කටයුතු සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර නොතිබුණි.<br>(i) අධිකරණ සේවා කොමිෂම් සභා ගොඩනැගිල්ල - රු.මිලියන 35<br>(ii) කොළඹ 07, ග්‍රෙගරි මාවතේ අංක B88 දරන නිල නිවස - රු. මිලියන 06<br>(iii) කොළඹ 07 ග්‍රෙගරිමාවතේ B 89 දරන නිල නිවස - රු. මිලියන 06 | ඇස්තමේන්තු සකස් කර ලබා ගත් ප්‍රතිපාදන අදාල කාර්යයන් සඳහා යෙදවිය යුතු වේ. | අමාත්‍යාංශය මගින් මෙම ව්‍යාපෘති ශ්‍රී ලංකා නාවික හමුදාව ලවා ඉටු කරවා ගැනිමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබුණි. මෙයට විකල්පයක් ලෙස මෙම ව්‍යාපෘතියට අදාල මුළු මුදලම නාවික හමුදාව වෙත ලබා දෙන්නේ නම් වැඩ ආරම්භ කර ගෙන යා හැකි බව ශ්‍රී ලංකා නාවික හමුදාව දන්වා සිටින ලදී. නමුත් මුදල් රෙගුලාසි අනුව වෙනත් දෙපාර්තමේන්තුවක් වෙත ප්‍රතිපාදන මුදා හැරීම හැර මුදල් ලබා දීමට නොහැකි බව අමාත්‍යාංශය විසින් දන්වා සිටි බැවින් ශ්‍රී ලංකා නාවික හමුදාව මෙම ව්‍යාපෘතිය භාර ගැනීම ප්‍රතික්ෂේප කර ඇත. එම නිසා මෙම මුළු ප්‍රතිපාදන ප්‍රමාණයම 2018 වසර තුළ ඉතිරි වී ඇත. |
| (ආ) “නව අධිකරණ ගොඩනැගිලි ඉදිකිරීම” යටතේ කන්තලේ අධිකරණ සංකීර්ණය ඉදිකිරිමට රු.මිලියන 400 ක මූල්‍ය ප්‍රතිපාදනයක් 2018, 2019 හා 2020 වර්ෂවල ලබා දීමට තීරණය වී තිබුණි. එසේ වුවද මෙම ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී අමතර ප්‍රතිපාදන යටතේ ලබාදුන් රු.මිලියන 100 ක්ලබා දී තිබුණ ද එම උපයෝජනය කරගෙන ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. | ඇස්තමේන්තු සකස් කර ලබා ගත් ප්‍රතිපාදන අදාල කාර්යයන් සඳහා යෙදවිය යුතු වේ. | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය වෙත මෙම ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමට අදාල ඇස්තමේන්තු හා සැලැසුම් ඉදිරිපත් කරන ලෙස දන්වා තිබූ අතර එම ආයතනය විසින් 2018 ජූලි 25 දින ඇස්තමේන්තුව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණි. අනතුරුව එය කිහිපවිටක් තාක්ෂණික ඇගයීම් කමිටු නිරීක්ෂණයන්ට අනුව සංශෝධනය කිරීමට සිදු වී ඇත. පුවත් පත් දැන්වීම් මඟින් මිල ගණන් කැඳවීමෙන් අනතුරුව මෙම ව්‍යාපෘතිය සඳහා 2018 නොවැම්බර් 19 දින තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ ලබා ගන්නා ලදී. ඉන් පසුව |

| | | |
|---|---|---|
| | | අමාත්‍ය මණ්ඩල වෙනස් වීම නිසා හා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව සංශෝධනය වීම මත 2018 වසරේ මෙම ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් ප්‍රදානය කිරීමට නොහැකි වූ බැවින් ආරම්භ කිරීමට නොහැකි විය. |

**3.3 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී ඉදිකිරීම් ආරම්භ කරන ලද අධිකරණ සංකීර්ණ 03 ක් ඉදිකිරීමට යෝජිත ඉඩම්, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයට අයිති බව සනාථ කිරීම සඳහා හිමිකම් ඔප්පු හෝ පැවරුම් සහතික විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ඉදිකිරීම් ආරම්භ කිරීමට ප්‍රථම ඉඩම් පිළිබඳ අයිතිය නිරවුල් කරගත යුතු වීම. | ඉඩම් පවරා ගැනීමට අදාල කටයුතු කරමින් පවතින බව දන්වමි. |

**3.4 පාඩු හා හානි**

--------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සිදුවූ වාහන අනතුරු දෙකට අදාලව තක්සේරු කරන ලද අලාභය හා රක්ෂණ හිමිකම අතර පැවති වෙනස අමාත්‍යාංශය මඟින් ගෙවා ඇති බව හානි පාඩු ලේඛනයේ සඳහන්ව ඇති නමුත් එම වටිනාකම වූ රු.94,939 ක මුදල අලාභයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | සිදු වූ සම්පූර්ණ අලාභයන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කළ යුතු වීම. | විගණන විමසුමේ දක්වා ඇති කරුණු පිළිගනිමි. මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා ඉදිරියේ දී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

**3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 04 කට සහ ඉකුත් වර්ෂයේ විගණන විමසුම් 09 කට 2019 ජුනි 20 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 155(1) හා මුදල් රෙගුලාසි 452 හි සඳහන් ප්‍රතිපාදන අනුව කටයුතු කළයුතු වීම. | විගණන විමසුම්වලට අදාල පැරණි ලිපිගොණු පරීක්ෂා කර කරුණු අධ්‍යනය කිරීමෙන් අනතුරුව පිළිතුරු සකස් කළයුතු වන බැවින් කාල පමාවක් සිදු වී ඇත. නමුත් ඉදිරියේ දී නියමිත දිනට විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට පියවර ගන්නා ලෙසට අදාල නිලධාරීන් දැනුවත් කරන ලද අතර මේ වන විට පිළිතුරු සකස් කරමින් පවතී. |

**3.6 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සියඹලාණ්ඩුව මහේස්ත්‍රාත් නිල නිවස ඉදිකිරීමේ ව්‍යාපෘතියේදී නිල නිවස වටා බැම්මක් ඉදිකිරීමට ඇස්තමේන්තු කර තිබුණත් ගේට්ටුවක් ඉදිකිරීමට ඇස්තමේන්තු කර නොතිබීම නිසා රු.130,489 ක අතිරේක ඇස්තමේන්තුවක් 2018 අගෝස්තු මාසයේ දී අනුමත කර තිබීමෙන් නිසි අයුරින් අවශ්‍යතා හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තු කර තිබුණු රු.70,460 ක් වටිනා වැඩ විෂයන් 09 ක් ඉටු කර නොතිබුණි. | අවශ්‍යතා හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා ඉදිරියේ දී පිළිතුරු ලබාදීමට කටයුතු කරන බව දන්වමි. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට 5456 ක් වූ මුළු සේවක පුරප්පාඩු සංඛ්‍යාව සම්පූර්ණ කිරීමට හා බඳවාගෙන තිබුණු 3976 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත්කර ගැනීමට කටයුතු කරනොතිබුණි. | සේවක පුරප්පාඩු සම්පූර්ණ කිරිමට හා අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට කටයුතු කළයුතු වීම. | අධිකරණ සඳහා නිලධාරින් බඳවා ගැනීම අධිකරණ අමාත්‍යාංශය මගින්ද අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් ද සිදු කරනු ලබයි. එබැවින් මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරිමට හා අතිරික්තව පවතින සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට කටයුතු කරමි. එමෙන්ම අධිකරණවල පවතින ඒකාබද්ධ සේවාවන්ට අයත් තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීම රාජ්‍ය පරිපාලන හා ආපදා කළමණාකරන අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබයි. |